# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## 2023 ජුනි මස 23 වන දින

## II වන කොටස

## අතිරේකය

(2023.06.26 දින නිකුත් කරන ලදී)


# නගර සභා (සංශෝධන)

*(පෞද්ගලික මන්ත්‍රීවරයන්ගේ පනත් කෙටුම්පතකි)*

**(255 වන අධිකාරය වූ) නගර සභා ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ජයන්ත කැටගොඩ මහතා විසින් පාර්ලිමේන්තුවේ දී ඉදිරිපත් කිරීම පිණිසයි


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක.

මිල : රු. 10.00 තැපැල් ගාස්තුව : රු. 150.00

මෙම ගැසට් අතිරේකය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## නගර සභා (සංශෝධන)

### (255 වන අධිකාරය වූ) නගර සභා ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

**ලුහුඬු නාමය**

**1.** මෙම පනත 2023 අංක        දරන නගර සභා (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

**255 වන අධිකාරයට 10(2)ඇ. අලුත් වගන්තිය ඇතුළත් කිරීම**

**2.** 1939 අංක 61 දරන නගර සභා ආඥාපනත සහ 1987 අංක 18 දරන නගර සභා (සංශෝධන) පනතේ (255 වන අධිකාරය වූ) 10(2)ආ වගන්තියට ඉක්බිතිව පහත සඳහන් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය එම පනතේ 10(2)ඇ. වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය:–

"(ඇ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීමක් පැවැත්වීම සඳහා ප්‍රකාශයට පත්කර ඇති අවස්ථාවක දී රටේ ඇතිවී ඇති යම්කිසි අර්බුදකාරී තත්ත්වයක් නිසා ප්‍රකාශිත පරිදි අදාළ ඡන්ද විමසීම පැවැත්වීමට නොහැකි වන තත්ත්වයක් පැන නැගී ඇති අවස්ථාවක ඉහත 10(2)ආ විධානය පරිදි අමාත්‍යවරයා විසින් ධුර කාලය දීර්ඝ කරන ලද කාල සීමාව මාස 12 ක් ඉක්ම වී තිබුණේ වී නමුත් අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලබන තවත් යම් කාලසීමාවක් සඳහා අදාළ විසිරුණු සභාව නැවත කැඳවීමට හැකි විය යුත්තේ ය.".

**අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව**

**3.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.